## චානක ඉලංගගේ 365



# ප්‍රේමයේ, ප්‍රේමණීය ගේය සිත්තම
# ප්‍රේමකීර්ති ද අල්විස්

ප්‍රේමයට කීර්තියක් වූ ප්‍රේම කීර්ති, නැතිනම් ප්‍රේම් මිය ගොස් මෙම ජූලි මාසයට වසර 26 ගතවෙයි. 1989 ජූලි මස 31 වන දින නාඳුනන (එදා හඳුනා නොගත්) සාහසිකයන් පිරිසක් විසින් සමරවීර මුදලිගේ දොන් ප්‍රේම කීර්ති ද අල්විස් නැතිනම් ප්‍රේම්ව මරා දමනු ලබන විට ඔහුගේ වයස අවුරුදු 42 පමණකි. මේ ජීවත් වූ වසර 42 කාලය තුල ප්‍රේම් සිංහල සංගීතයට, සිංහල මාධ්‍යකරණයට සහ ලේඛන කලාවට කර ඇති මෙහෙය පරම්පරා ගණනකට සෑහේ. මේ අතරිනුත් ප්‍රේම් සිංහල ගේය සාහිත්‍යයට කරනු ලැබූ බල පෑම සුළු කොට තැකිය නොහැකිය. සිංහල ගීත වංශ කතාවේ එක යුගයක් ලියවෙන්නේ ප්‍රේම ගේ නමටය. සිංහල ගීතයේ ඔහු තැබූ ප්‍රේමණීය ලකුණ තව පරම්පරා සිය ගණනක් තෙක් පවතිනු නොඅනුමානය. ප්‍රේම් ව හැබැහින් නොදැක, ප්‍රේම්ගේ ගේය පදකරණය නිසාම ප්‍රේම්ට ආදරය කරන වුන් අතර මමද ඉදිරියෙන්ම සිටිමි. මා මෙන් ප්‍රේම්ට නොදැක ආදරය කරන උන් බොහෝ වෙති. ඒ අතර ඔහුව ඇසුරු කරන්ට, ඔහුගෙන් ගුරු හරුකම් ගන්න, ඔහුත් සමග මිත්‍ර සමාගම් පවත් වන්න වාසනාව ලද කීප දෙනෙකු ප්‍රේම් පිලිබඳ මතකය අවදි කලේ මේ අයුරිනි .

ප්‍රේම් කියූ සැනින් මතකයට එන අනෙක් නම නම් වික්ටර් රත්නායක යන නාමයයි. ප්‍රේම් වික්ටර් සුසංයෝගය සිංහල ගීතය නවමාණයකට ගෙන ගිය බව නොරහසකි. වික්ටර් රත්නායකයන්ගේ බාල පුතණුවන් වන ලෙලුම් රත්නායකයන් ප්‍රේම කීර්තීන් පිළිබඳව තම මතකය අවදි කළේ මේ අයුරිනි.



ප්‍රේම් මාමා නැතිවෙන කොට, (නැති උනා නෙ- මෙයි ඔහුව අපෙන් උදුරා ගන්නකොට) මම පාසල් යන වයසේ දරුවෙක්. අපේ පවුල සහ ප්‍රේම් මාමා අතර තිබුනේ දන්න ඇයි හොඳයියකට වඩා එහා ගිය ලොකු සහෝදර බැඳීමක්. විශේෂයෙන් මගේ පියාණන් ප්‍රේම් මාමාට සැලකුවේ තමන්ගේම සහෝදරයෙකුට වගෙයි. මට මතකයි ප්‍රේම් මාමා නැති උනා කියන පණිවිඩය පවා ඉස්සෙලම ආවේ අපේ ගෙදරටයි. මම මගේ ජීවිතයේ මගේ පියාගේ ඇස්වල පලමු වතාවට කඳුළු දැක්කේ ඇත්තටම එදයි . මට හැඟෙන විදිහට මගේ පියාණන් අදටත් ඒ අවාසනාවන්ත මරණය ගැන කම්පා වෙනවා. ඒ නිසාම වෙන්න ඇති අදටත් ,ප්‍රේම් මාම නැතිවෙලා වසර 26 ගෙවිලත්, සෑම වසරකම එතුමා වෙනුවෙන් පින්කම් කටයුතු සංවිධානය කරමින් ඔහුගේ ගුණ සුවඳ සිහිකරන්නේ .

අපේ ගෙදර දොර ප්‍රේම් මාමට හැම වෙලාවේම ඇරිලයි තිබුනේ . එතුමාට අපේ ගෙදර එන්න විශේෂ හේතුවක් ඕන උනේම නෑ. බොහෝ වෙලාවට මීවිත ටිකක් තොලගා අවසන්ව ඔහු රැගත් ටැක්සිය නවතින්නේ අපේ ගෙදර ගේට්ටුව ලඟයි. අපේ කුඩා කාලයේ අපිට දහම් පාසලට , නැතිනම් ඉස්කෝලෙට මොකක් හරි ගීතයක් ඕන වෙච්ච ගමන් ඉතින් අපි නවතින්නේ ප්‍රේම් මාමා ලඟයි. කලාකරුවෙකුට වඩා ප්‍රේම් මාමා අපිට සමීප වන්නේ අපේම පවුලේ සාමාජිකයෙක් විදිහටයි . එතුමා නැති අඩුව එදාට වඩා අද සමා- ජයට දැනෙනනවා . එතුමාගේ මරණය ගැන කතා කෙරුවොත් ,ඇත්තටම එක හරිම අවාසනාවන්ත මරණයක් . හරියට අර අහිංසක සමනලයෙක්ව පයට පාගලා පොඩිකරලා දැම්ම වගේ වැඩක් තමයි ඔවුන් කළේ. මොකද අපි හොඳටම දන්නවා ප්‍රේමකීර්ති කියන්නේ කොච්චර අහිංසක චරිතයක්ද කියන එක. එතුමා විහිළුවටවත් තව කෙනෙකුගේ හිතක් රිදවන ජාතියේ කෙනෙක් නෙ- මෙයි. වැඩිය ඕන නැහැ එතුමාගේ ගීත රචනා දිහා බැලුවහොත් ඕන කෙනෙකුට වටහා ගන්න පුළුවන් ප්‍රේම් කියන්නේ කොච්චර සංවේදී චරිතයක් ද කියලා. අනේ ඉතින් එහෙම මනුස- "සයෙක්වනේ අරවිදිහට තමගේ බිරිඳ ගේ ඇස්දෙක ඉස්සරහම හිතක් පපුවක් නැතිව මරා දාන්නේ. එක පැත්තකින් මට හිතෙනවා (එතුමාගේ ඝාතනය සාධාරණී කරණය කරනවා නෙමෙයි) ඒ මරණය ඉතාම අවාසනාවන්ත මරණයක් උනත් ඒ , අද පවතින මේ වාණිජකරණය වූ සහ දේශපාලනීකරණයවූ සමාජ සංස්කෘතිය තුල නිර්මාණ කරුවෙකු ලෙස ජීවත් වෙනවට වඩා ඒ සිදුවූ සිදු වීම හොදයි කියල. අද ඒ මියගිය ප්‍රේම් සදාකාලිකවම අපේ හදවත් තුල ජීවත් වෙනවා. අද ඒ මිය ගිය ප්‍රේම්ට එදා ජීවත් වුන ප්‍රේම්ට නොතිබුන වටිනා කමක් තියෙනවා. බොහෝවිට අපිට යමක වටිනාකම දැනෙන්නනම් ඒ දේ අපෙන් දුරස් වෙන්න ම ඕන , අපිට ඒ දේ නැතිවෙන්නම ඕන. ප්‍රේම කීර්තීන්ටත් සිදු වුයේ ඒ දෙයමයි.

ලෙලුම් ගෙන් සමුගත් මා නතරවූයේ ප්‍රේම්ගේ සමකාලීනයෙකු වූ සමන් අතාවුදහෙට්ටි ළඟය. මේ සමන් ප්‍රේම් පිළිබඳව ඔහුගේ මතකය අවදි කළ ආකාරයයි .

මගෙත් ප්‍රේම කීර්තිගේත් මිතුරු කම උපදින තිඹිරි ගෙය වුයේ ගුවන් විදුලි සංස්ථාවයි. මේ ඔහු සහන නිවේදකයෙකු ලෙසත් මම ළමා ශිල්පියෙකු ලෙස මුලින්ම ගුවන් විදුලියට එක්වූ සමයයි. අපි අතරේ වයස් පරතරය වසර දහයක් පමණ උවත් කිසිදිනෙක එය අපේ මිත්‍රත්වයට බලපෑවේ නෑ. කලින් ප්‍රේම අයියා උනත් පසුව මිතුරු ඇසුර නිසාම ඔහු මට අනෙක් යට සේම පොඩි මාස්ටර් වෙනවා. මට මතකයි ඒ වකවාණුවේ ගුවන් විදුලිය බැබුලූ මාස්ටර්ලා තිදෙනෙක් හිටියා. ඒ ලොකු මාස්ටර් තිලක සුදර්මන් ද සිල්වා, මැද මාස්ටර් අමර බන්දු රූපසිංහ සහ පොඩි මාස්ටර් ප්‍රේමකීර්ති. ඔහු කිසි කලෙක අලුතින් එන පරපුරේ මග අහුරපු නැති සන්නිවේදකයෙක්. අලූත් පරම් පරාවට හැමවිටම ගුරුහරු කම් සහ අත හිත දුන් සන්නිවේදකයෙක්



පොඩි මාස්ටර් ඔහුගේ ජනමාධ්‍ය භාවිතය අරඹන්නේ විසිතුර පුවත් පතෙනි. අලූත් විදිහට සිතීම සහ අලූත් විදිහට දැකීම තමයි පොඩි මාස්ටර් සතුවූ ලොකුම අවිය. ඔහු රේඩියෝ මාධ්‍ය සියුම් හා විචක්ෂණ ලෙස බාවිතා කල අයෙක්. රූප වාහිණිය ඔස්සේ විස්කම් දැක්වූ පූරකයෙක් .ඔහුගේ විද්‍යුත් මාධ්‍ය භාවිතාවේ සුවිශේෂත්වය වන්නේ නිපුණත්වය සහ ජනප්‍රියත්වය යන දේ අංශයෙන්ම අග තැම්පත් වීමයි .රේඩියෝ වැඩ සටහන් නිෂ් පාදකයෙකු ලෙසත් එතුමා ප්‍රකට කලේ විශිෂ්ට කුසලතාවක් .

සමන් අයියගෙන් පසුව මම නවතින්නේ ප්‍රේම් ගේ සමකාලීනයෙකු මෙන්ම ප්‍රේම්ගේ ගීත බොහො මයකට සංගීතයෙන්ද දායක වූ එච් . එම් ජයවර්ධනයන් සමගය. මන්ද මා දන්නා ලෙස ම එච් .එම් ජයවර්ධනයන්ටද ප්‍රේම ගැන කියන්නට බොහෝ දෙ ඇති නිසාය.



ප්‍රේම් කියන්නේ මට මිතුරෙක් විතරක්ම නොවෙයි ඔහු ඇත්තට මගේ සංගීත චාරිකාවේ එක අත් වැලක්. ප්‍රේම් ගැන මට කියන්න බොහෝ දේ තිබුනත් මම කෙටියෙන් කියන්නම්. ප්‍රේම කියපු ගමන් මගේ මණසට නැගෙන චිත්‍රය තමයි, දිනක් මාලනීට (මාලනී බුලත් සිංහලට) සරල ගී වැඩ සටහනකට ගීයක් අඩු වෙලා මම ගියා ප්‍රේම් ව හොයා ගෙන ගීයක් ලියා ගන්න. එතකොට ප්‍රේම් මට මතක විදිහට හිටියේ දෙල්කඳ හන්දියේ, මම ඉතින් ගිහිල්ල ප්‍රේම්ට කතා කළා. කතා කළාම ඔව් ජයේ, පොඩ්ඩක් ඉන්න කියුව. මට ඉතින් කුස්සියෙන් ඇහෙනවා ප්‍රේම් කියනවා (මෙයා බෝංචි හොද්දක් හදනවා) අපි ලූණු ටිකක් දාමු, තව මිරිස් ටිකක් දාමු, ඔය වගේ දේවල් හැබැයි ගැහැණු කට හඬක් නැහැ. මම ම පස්සේ කුස්සියට ගියා . පස්සේ මට කියුව "ජයේ අද මම තනියම ගෙදර" කියල පසුව මම ආපු කාරණය ඔහුට කියුවා. බෝංචි හොද්ද ලිපෙන් තියපු ප්‍රේම් තෙත අතින් කොළයක් අරගෙන මෙන්න මෙහෙම ලියල මට දෙනවා.

"මා එක්කලා අමනාපව වී දබර
දූගේ තාත්තා එන්නේ නෑ ගෙදර"

මට අදහ ගන්න බැරුව ගියා. මෙයා මෙයා ගේම අත්දැකීම අනිත් පැත්තට හරවල කාන්තාවකට කියන්න පුළුවන් විදිහට ලියලා. විනාඩි දහයක් වත් ගියේ නැහැ. ප්‍රේම් කියන්නේ ඔන්න ඔය වගේ පුදුම හැකියාවක් තිබුන චරිතයක් .

ප්‍රේම් කියන්නේ ඉතාම සරල නිරහංකාර චරිතයක්. කිසිම දවසක මට මතක විදිහට සපත්තු දෙකක් ඇන්දේ නැහැ. කමිසය පවා බොහෝවිට පොඩිවෙලයි තිබුනේ. සරල කියන්නේ සරල කමට ප්‍රේම් ට වඩා තවත් හොඳ උදාහරණයක් නැති තරම්. ප්‍රේම් ගේ මරණය ගැන මතක් වෙන කොටත් මට අදටත් හරිම දුකයි. මොකද ප්‍රේම් වගේම මටත් එදා මරණ වරෙන්තුව දීලයි තිබුනේ. මට අඩුම තරමේ ප්‍රේම්ගේ මරණයටවත් යන්න බැරිඋනා. මොකද එක්තරා පක්ෂයකින් මටත් ඒ වෙනකොට මරණ වරෙන්තුව දීලයි තිබුනේ. මම අදටත් දුක් වෙනවා ඒ අහිංසක මනුස්සයාගේ මරණය ගැන. අද ප්‍රේම් හිටියානම් සංගීතය වෙනුවෙන් කෙතරම් තරම් වැඩ කොටසක් කරන්න තිබුනද .

ප්‍රේම්... අපේ අවාසනාවට, අපේ පරපුරේ අවාසනාවට දේශපාලන පරගැත්තන් නුඹව අපෙන් උදුරාගෙන හමාරය. නමුත් මියගිය නුඹ නොමල හදවත් තුල අදටත් ජීවත් වෙයි. උන් නුඹේ ගේය පද වැල අදටත් ගයයි. පුරන් වූ මේ ගී කෙත තව එකම එක වරක් හෝ අස්වද්දනු වස්, නොමිනිසුන් නැති කලෙක මිනිසත් බව ලැබ අප අතරම ඉපදේවා.

මියෙන ලොව නොමියෙන ගේය පද වැල .....ප්‍රේම්




**ජ්‍යොතිශය**
ASTROLOGY

- භාව කේන්ද්‍රය අනුව පලාපල කථනය
- කේන්ද්‍ර සෑදීම හා නැකත් සෑදීම
- පොරොන්දම් බැලීම හා විවාහ දෝෂ පරීක්ෂාකිරීම

සියළු ජ්‍යොතිශ කටයුතු සඳහා විමසන්න
ජ්‍යොතිර්වේදී
**දේවසිරි විද්‍යාරත්න** MA
(03) 90777523 / 0404 327 562